**තානාපති තුමාගේ කථාව**

සම්භාවනීය අමුත්තනි. නෝනාවරුනි, මහත්වරුනි.

ඔබ සියලු දෙනාට ම සුබ උදෑසනක් වේවා යයි පතමි.

මෙම රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාර (PPP) පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයේ දී මෙවැනි සම්භාවනීය පිරිසක් ඇමතීමට ලැබීම මට විශාල සතුටක් ගෙන දෙන අතර මා එය ගෞරවයක් ලෙස ද සලකමි.

ලෝකය පුරා විවිධ රටවල ආර්ථික හා සමාජීය සංවර්ධනයේ වැදගත් නව ප්‍රවණතාවක් දැකිය හැකි බව පෙනේ. කලින් ආවේණික වශයෙන් රජයේ කාර්යයන් ලෙස සලකන ලද කටයුතු වලට දැන් පුද්ගලික අංශය වැඩි වැඩියෙන් යොමු වන බව පෙනේ.

මෙය අවබෝධ කර ගත් ලොව පුරා ආණ්ඩු පරිසරය ආරක්ෂා කිරීම, යටිතල පහසුකම් අවශ්‍යතා, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනය, අධ්‍යාපනය, තාක්ෂණය, හා තරුණ විරැකියාව වැනි පුළුල් පරාසයක ගැටලු විසඳීමට පුද්ගලික අංශයේ දේශීය හා ගෝලීය සංවිධාන සමග හවුල් ව්‍යාපාර ආරම්භ කර තිබේ.

මෙම නවතම රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර මොඩලය, ලොව පුරා රාජ්‍ය ව්‍යාපාර හා ප්‍රජාවන් මුහුණ දී ඇති සංකීර්ණ ප්‍රශ්න විසඳීමට ඔවුන්ගේ ප්‍රාග්ධනය හා ආයෝජන, නිර්මාණශීලීත්වය හා වෙළඳපොළ ප්‍රවේශය යොදා ගනිමින් හවුල්කරුවන්ගේ වත්කම් හා අත්දැකීම් එක් කරයි. මෙම මොඩලය සංවර්ධනය වන රටවල දීර්ඝ කාලීන ආර්ථික හා සමාජීය සංවර්ධනයට විශාල දායකත්වයක් සපයන බවට කිසිම සැකයක් නැත.

සංවර්ධනය වන රටවල හොඳ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා, එක්සත් ජනපදය එහි සංවර්ධන අංශය වන අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) තුළින් විවිධ රටවල මෙම මොඩලය භාවිතයට ගැනීමට සහාය වී තිබේ.

යටිතල පහසුකම් ඇතුළු පොදු සේවාවන්ට ඇති යෝධ ඉල්ලුම සපුරාලීම සඳහා ලොව පුරා රජයන් දැන් රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර (PPP) කෙරෙහි අවධානය යොමු කර ඇත. රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාරවලට ආකෘති ගණනාවක් තිබේ. එය සරල ගිවිසුමක සිට සංකීර්ණ වූ - ඉදි කර- ක්‍රියාත්මක කර- පැවරීමේ- ගිවිසුම් දක්වා වෙනස් විය හැකියි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන ගණනාවකට ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රීය හා ආර්ථික ප්‍රතිසංස්කරණ ඉලක්ක කරා ළඟා වීමට ආධාර කරමින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) මෙම ආයතන සමග ඉතා සහයෝගී ව කටයුතු කරයි. උදාහරණයක් වශයෙන් අපි ඉතා මෑත දී රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර ගැන වාර්තාවක් පළ කිරීමට මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය මුදල්

දෙපාර්තමේන්තුවට සහාය වූයෙමු. ජාත්‍යන්තර භාවිත සමග සංසන්දනය කරමින් රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාරවල වර්තමාන නෛතික, නියාමන හා ව්‍යාපාරික පරිසරය ඇගයීමට ලක් කරන මාර්ග සිතියමක් පිළියෙල කිරීම ද මෙයට ඇතුළත් විය. මෙම වාර්තාවත්, මාර්ග සිතියමත් පදනම ලෙස ගනිමින් රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර සඳහා මූලික ව්‍යුහයක් සකස් කිරීමට ද අපි රජයට සහාය වෙමු. මෙම වාර්තාවේ අඩංගු නිර්දේශ වන රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර සඳහා ජාතික ඒකකයක් හා ජාතික කමිටුවක් ස්ථාපිත කිරීම, රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර සඳහා ජාතික ප්‍රතිපත්තියක් හා මූලෝපායක් සකස් කිරීම හා නෛතික හා නියාමන රාමුව සංශෝධනය කිරීම ආදි කටයුතු වලට ද අපි සහාය වෙමු.

ආසියානු සංවර්ධන බැංකුවේ පර්යේෂණවලට අනුව 2010 සිට 2020 දක්වා කාලය තුළ ආසියා පැසිෆික් කලාපයට අඩු ම වශයෙන් ඩොලර් ට්‍රිලියන 8ක පමණ යටිතල පහසුකම් සඳහා වූ ආයෝජනයක් අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාව සපුරාලීමට සාම්ප්‍රදායික රාජ්‍ය අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින් බොහෝ රටවල් රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර තුළින් පෞද්ගලික අරමුදල් යොදා ගැනීමට උත්සාහ කරයි.

රාජ්‍ය-පුද්ගලික ව්‍යාපාර පිහිටුවීම අතින් ශ්‍රී ලංකාව ඉදිරියෙන් ම සිටින බව මා ප්‍රකාශ කරන්නේ ඉතා සතුටෙනි. 1990 දශකයේ සිට ශ්‍රී ලංකාව මෙවැනි හවුල් ව්‍යාපාර ක්‍රියාත්මක කර ඇති අතර එවැනි ව්‍යාපාර 70කට වැඩියෙන් ඇති බව අපි දනිමු. දළ වශයෙන් ඩොලර් බිලියන 6කට වැඩි ආයෝජනයක් සහිත මෙම ව්‍යාපාර විදුලි බලය, විදුලි සංදේශ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, වරාය යන අංශවල වේ. අතිකුත් සංවර්ධනය වන රටවල මෙන් මෙම අංශවල හවුල් ව්‍යාපාර ක්‍රියාත්මක කරන ලද්දේ ඒ ඒ අංශවල ටෙන්ඩර් නීති යටතේ වන අතර ඒවා ක්‍රියාත්මක වූයේ එකිනෙකට වෙනස් ප්‍රතිපත්ති යටතේ ය.

මෑත දී මෙගාපොලිස් හා බස්නාහිර කලාප සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කිරීමෙන් යටිතල පහසුකම් සඳහා වැඩිපුර රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර පිහිටුවීමට රජය ප්‍රධාන පියවරක් ගෙන තිබේ. මෙම අමාත්‍යාංශය බටහිර යුරෝපීය හා එක්සත් ජනපද මොඩල ප්‍රයෝජනයට ගනී. රජයේ දායකත්වයක් අවශ්‍ය වන සෑම විටම පළමුවැනි විකල්පය ලෙස සැලකිය යුත්තේ රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපාරයි.

මෙයට හොඳ උදාහරණයක් වන්නේ කොළඹ වරායේ නැගෙනහිර බහාලු පර්යන්තයේ දෙවැනි අදියරයි. වරායේ කාර්යක්ෂමතාව හා ධාරිතාව වැඩි කිරීමත්. නැවෙන් නැවට බඩු පැටවීමේ වෙළඳපොළ පංගුව වැඩි කර ගැනීමත් අරමුණු කර ගත් මෙම ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා රජයේ, ආසියානු සංවර්ධන බැංකුවේ හා පුද්ගලික අංශයේ ආයෝජන හා තාක්ෂණය එක් කරන ව්‍යාපෘතියකි. එහි ඇති මීටර් 400 ගැඹුරු නැව් රඳවනය ක්‍රියාත්මක කිරීම, එම රඳවනයේ ඉතිරි මීටර 800 සැලසුම් කිරීම, ඉදි කිරීම, මුදල් යෙදවීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ.

මෙය, ගෝලීය හා කලාපීය වෙළඳාම සඳහා යළි නැව් ගත කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස කොළඹ වරායේ මූලෝපාය පිහිටීම ශක්තිමත් කිරීමට රාජ්‍ය හා පුද්ගලික අංශයේ හවුල්කරුවන්ට කටයුතු කළ හැකි බව පෙන්වා දෙන හොඳ උදාහරණයකි.

ආසියාවේ වැඩිපුර ම රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර දැකිය හැකි වන්නේ බලශක්ති ක්ෂේත්‍රයේ වන අතර ප්‍රවාහන, ජල හා පල්දෝරු අංශවල ද මෙවැනි ව්‍යාපාර දකින්නට ලැබේ. සමාජීය අංශයේ ද දැන් වැඩියෙන් හවුල් ව්‍යාපාර දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් අධ්‍යාපන අංශයේ තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපන පුහුණු සේවා (TVET) සඳහා රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපාර යොදා ගැනේ. මේ අනුව ආර්ථික සංවර්ධනයට පමණක් නොව සමාජීය සංවර්ධනයට ද රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාරවලට දායකත්වයක් සැපයිය හැකි බව පෙනේ. මෙම කලාපයේ විශාල ම රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපාර වෙළඳපොළ ලෙස ඉදිරියට පැමිණ ඇත්තේ ඉන්දියාව හා චීනයයි. ලෝක බැංකුවේ දත්තවලට අනුව 2000 හා 2013 අතර කාලයේ ඉන්දියාව රාජ්‍ය-පුද්ගලික ව්‍යාපාර 600කට වැඩි ගණනකට ගිවිසුම් අත්සන් කර ඇති අතර මෙයින් බොහොමයක් ප්‍රවාහන හා බලශක්ති අංශවල වේ. මේ කාලය තුළ චීනය රාජ්‍ය-පුද්ගලික ව්‍යාපාර 800කට වැඩි ගණනකට ගිවිසුම් අත්සන් කර ඇත.

කෙසේ වෙතත් රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමට බොහෝ සැලසුම් හා ආරම්භක කටයුතු කළ යුතු බව අපි අවබෝධ කර ගත යුතු වෙමු. රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම අතින් සාර්ථක වාර්තාවක් ඇති රාජ්‍යයන්ට මෙවැනි ව්‍යාපෘති සැලසුම් කිරීම හා අරමුදල් ලබා ගැනීම පිළිබඳ ව මග පෙන්විය හැකියි. පුද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අත්‍යවශ්‍ය "බලදායී පරිසරයක්" නිර්මාණය කිරීමට අතිරේක පියවර ගත යුතු වේ. මෙයට ශක්තිමත් නෛතික හා නියාමන රාමුවක් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පාරදෘශ්‍ය භාවය හා අවංක බව සහතික කරන ඒ සඳහා කැප වූ රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර ඒකකයක් ද අවශ්‍ය වේ.

රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම එක්සත් ජනපද රජයේ ප්‍රධාන කාර්යයක් වන අතර අපට ලොව පුරා තිරසාර රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපාර වැඩසටහන් සැලසුම් කිරීම හා ඉදිකිරීම ට ආධාර කිරීම අතින් ප්‍රබල අත්දැකීම් තිබේ.

ශ්‍රී ලංකාවේ ද විශේෂඥ පුහුණු වැඩසටහන් හා වඩාත් කාර්යක්ෂම, පිරිවැය ඵලදායි හා පහසු මෙන් ම රජයේ ක්‍රියාවලිය වඩාත් පාරදෘශ්‍ය හා වගකියන තත්වයට පත් කරන ඉලෙක්ට්‍රොනික රාජ්‍ය ප්‍රසම්පාදනය (e-GP) වැනි නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් බලදායී පරිසරය වැඩි දියුණු කිරීමටත් එක්සත් ජනපද රජය ආධාර කර තිබේ.

යහපාලනය තව දුරටත් ශක්තිමත් කරන, රාජ්‍ය ක්‍රියාවලි වඩාත් පාරදෘශ්‍ය හා වගකියන තත්වයට පත් කරන, ජාතික ඉලෙක්ට්‍රොනික රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියක් පිහිටුවීමට රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර යොදා ගත හැකි වේ. රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර සඳහා නවීකරණය හා නව

තාක්ෂණය අවශ්‍ය වන අතර ඒවා සඳහා විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කළ යුතු වේ. මේ නිසා රජය වෙනුවෙන් ඉ-රාජ්‍ය කටයුතු හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා සැපයීමට පුද්ගලික අංශය යොදා ගැනීම දෙපාර්ශවයටම ම වාසි දායක විසඳුමක් වනු ඇත.

මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද ආයතනයේ (USAID) අනුග්‍රහයෙන් අද ආරම්භ වන මෙම ජාතික සම්මන්ත්‍රණය, පාරදෘශ්‍ය බව, වග වීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, සිවිල් සමාජ සහභාගීත්වය හා තොරතුරු ලබා ගැනීම ඇතුළු ජාත්‍යන්තර ප්‍රමිති හා යහපත් භාවිතයන්ට අනුව රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර පිහිටුවේ ක්‍රමෝපාය හා ශිල්පීය ක්‍රම ගැන සාකච්ඡා කිරීමට රාජ්‍ය නිලධාරීන්ට අවස්ථාවක් ලබා දෙනු ඇත.

රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර මොඩලයක් උපයෝගී කර ගැනීමටත්, සංස්ථාගත කිරීමටත් එක්සත් ජනපද රජය ශ්‍රී ලංකාවේ රජයට හා ජනතාවට සහාය වන්නේ ඉතා සතුටෙනි. පසුගිය අවුරුදු හැටක් තිස්සේ කළ ආකාරයට ඔබේ ජීවිත හා අනාගතය සමෘද්ධිමත් කිරීමට අපි දිගටම සංවර්ධන හා මානුෂීය ආධාර සපයමු. මේ වන විට එක්සත් ජනපද රජය, ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය, පරිසරය, ස්වාභාවික සම්පත්, සෞඛ්‍යය, අධ්‍යාපනය, යහපාලනය හා මානුෂීය ආධාර ආදී විවිධ ක්ෂේත්‍රවලට ඩොලර් බිලියන 2කට වැඩි ප්‍රමාණයක සංවර්ධන හා මානුෂීය ආධාර සපයා තිබේ.

රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර හා ඉලෙක්ට්‍රොනික රාජ්‍ය ප්‍රසම්පාදනය වැනි ක්ෂේත්‍රයන්හි පුහුණුව හා හැකියා ගොඩ නැගීමට ආධාර කිරීමෙන් අපි ප්‍රබල රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර බලදායී කෙරෙන පරිසරයක් ගොඩ නගන අතර එය අනාගතයේ රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාරවලට සහභාගී වීමට පුද්ගලික අංශය දිරිගැන්වීමක් වනු ඇත.

අවසාන වශයෙන් මෙම සම්මන්ත්‍රණයේ කටයුතු හොඳින් සිදු කිරීම ගැන එහි සංවිධායකයන්ටත් කොතරම් කාර්ය බහුල වුවත් මෙයට සහභාගී වීමට පැමිණි සියලු ම නිලධාරීන්ටත් ස්තුති කිරීමට කැමැත්තෙමි. අලුත් ම දැනුම, අත්දැකීම් හා භාවිතයන් ගැන අදහස් හුවමාරු කර ගැනීමට මෙය කදිම අවස්ථාවකි.

මෙය ප්‍රයෝජනවත් හා අවබෝධය වැඩි කරවන සම්මන්ත්‍රණයක් වනු ඇතයි යන්න මගේ අපේක්ෂාවයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර ප්‍රවර්ධනය කරන වැඩිදුර සාකච්ඡාවල දී ඔබ සැම හමුවීමට ද මම බලාපොරොත්තු වෙමි.

ඔබ සියලු දෙනාට ම ඉතාමත් ස්තුතියි.